# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,938/6 — 1970 දෙසැම්බර් 29 වැනි අඟහරුවාද — 1970.12.29**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)**

## ආණ්ඩුවේ නිවේදන

**අංක :** ඇල්. ඩී.-බී. 65/44 — අ. ආ. කා. අංකය : එන්. 127/70.

### පරීක්ෂණ කොමිෂන් සභා පනත

ධීවර සංස්ථා පරීක්ෂණ කොමිෂන් සභාව—කාලය දීර්ඝ කිරීම

ලංකා ධීවර සංස්ථාවේ ක්‍රියාකාරිත්වය හා පරිපාලනය පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කිරීමේ කාර්‍ය සඳහා (393 වැනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2වැනි වගන්තිය යටතේ 1970, අගෝස්තු මස 17 වැනි දින අංක 14,919/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1970, අගෝස්තු මස දහහත් වැනි දින දරණ බලපත්‍රයෙන් පත් කරන ලද කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීමේ කාලය, එකී පනතේ 4 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1971, මාර්තු තිස් එක් වැනි දිනය තෙක් දීර්ඝ කර ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය,
මහනුවර, 1970 දෙසැම්බර් 27 වැනි දින.

**12—1401.**

---

ඇල්.ඩී—බී. 43/48 — අ. ආ. කා. අංකය : සී. 318/70.

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

82 වැනි වගන්තිය යටතේ වාර්තාව

1961 අංක 72 දරන පනතින් සංශෝධිත (381 වැනි අධිකාරය වන) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 82 ඇ (2) (අ) වැනි වගන්තියෙන් නියමිත පරිදි, අංක 126 දරන වැලිමඩ මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් රත්නායක මුදියන්සේලාගේ බණ්ඩාර තෝරා පත් කිරීමට විරෝධය පළ කැරුණු මැතිවරණ පෙත්සම විභාග කළ මැතිවරණ විනිශ්චයකරුගේ වාර්තාවේ පිටපතක් මෙහි පහත පළ කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1970 දෙසැම්බර් 28 වැනි දින,
මහනුවරදිය,

### 1970 අංක 1 දරණ මැතිවරණ පෙත්සම

**1970 අප්‍රේල් මස 23 වැනි දින අංක 126 දරන වැලිමඩ මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් පවත්වන ලද මැතිවරණය**

වැලිමඩ, වැලිමඩගම '' ශ්‍රියානි '' නැමති ස්ථානයෙහි පදිංචි පර්සි සමරවීර..............................පෙත්සම්කරු.

වී.

1. කැප්පෙටිපොල, බෝගහකුඹුර පාරේ රත්නායක මුදියන්සේලාගේ බණ්ඩාර ;
2. අංක 126 දරන වැලිමඩ මැතිවරණ කොට්ඨාශයේ තේරීම් භාර නිලධරයා වශයෙන් බදුල්ල කච්චේරියේ බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති වූ ආනන්ද මාදෙන ;
3. අංක 126 දරන වැලිමඩ මැතිවරණ කොට්ඨාශයේ සහකාර තේරීම් භාර නිලධරයා වශයෙන් බදුල්ල කච්චේරියේ බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ උපදිසාපති වූ, සී. දිසානායක,..............................යන වග උත්තරකරුවන්ට.

අංක 126 දරන වැලිමඩ මැතිවරණ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් රත්නායක මුදියන්සේලාගේ බණ්ඩාර තෝරා පත් කිරීමට විරෝධය පළ කොට 1970 මැයි මස 7 වැනි දින පර්සි සමරවීර විසින් ඉදිරිපත් කරන ලද මැතිවරණ පෙත්සම් විභාගයේදී 1970 අප්‍රේල් 23 වැනි දින පැවැත්වුණු නාම යෝජනා කිරීමේදී/මැතිවරණයේදී යම් අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව නැතහොත් ඔහුගේ නියෝජිතයා විසින් හෝ වෙන යම් තැනැත්තකු විසින් කිසිම දූෂණ ක්‍රියාවක් හෝ නීතිවිරෝධී ක්‍රියාවක් කරනු ලැබ ඇතැයි ඔප්පු වී නැති බව (381 වැනි අධිකාරය වන) 1946, ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 82 වැනි වගන්තිය අනුව මෙයින් වාර්තා කරමි.

1970 ජූලි මස 8 වැනි දින මගේ අත්සන යොද දෙන ලදී.

ඒ. සී. ඒ. අලස්,
මැතිවරණ විනිශ්චයකාර.

12–1400.


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි

974/13—කේ 11—11,025 (70/12)